## ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ මගී සේවා අවසරපත්‍ර කොන්දේසි උල්ලංඝනය වෙනුවෙන් ගනු ලබන ක්‍රියා මාර්ග

**1)** (i) මගීන් සඳහා වලංගු අසීමිත රක්ෂණ බලපත්‍රයක් නොමැතිව ධාවනය කිරීම සහ වලංගු බස් රථ රක්ෂණයක් නොමැතිව ධාවනය කිරීම. (VS-01)

(ii) වලංගු රියදුරු බලපත්‍රයක් නොමැති රියදුරකු සේවයේ යෙදවීම. (SE - 01)

(iii) මත් ද්‍රව්‍ය හෝ මත්පැන් පානය කර බස්රථවල සේවයේ යෙදීම. (SE - 02)

- පළමුවර පරිපාලන සේවා ගාස්තුව රු. 25,000/=
- දෙවනවර පරිපාලන සේවා ගාස්තුව රු. 25,000/= + මාස 03 කට අවසරපත්‍රය අත්හිටුවීම

ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ අභිමතය පරිදි මගී සේවා අවසරපත්‍රය අවලංගු කිරීමට කටයුතු කිරීම.

**2) ධාවනය වන අවස්ථාවේදී, (SE - 03)**

(i) වලංගු මගී සේවා අවසරපත්‍රය සහ අවසරපත්‍ර ලේබලය බස්රථයේ තබා නොගැනීම.

(ii) ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ නිසි අවසරයකින් තොරව වලංගු මගී සේවා අවසරපත්රයකින් බලය ලබාදී ඇති මාර්ගයෙන් බැහැරව ධාවනය කිරීම.

- පළමුවර පරිපාලන සේවා ගාස්තුව රු. 2,000/=
- දෙවනවර පරිපාලන සේවා ගාස්තුව රු. 5,000/=
- තෙවැනිවර පරිපාලන සේවා ගාස්තුව රු. 7,500/=

වාර 4 හෝ ඊට වැඩි වාර ගණනකදී ජාතික ගමනාගමන කොමිෂන් සභාව තීරණය කරන කාලසීමාවකට මගී සේවා අවසරපත්‍රය අත්හිටුවීම.

**3)**

(i) නියමිත බස් ගාස්තුවට අඩු හෝ වැඩි ගාස්තු අයකිරීම. (SE - 04)

(ii) ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් නිකුත් කර ඇති අනුමත කාල සටහන හෝ අනුමත කාල සීමා ඉක්මවා/උල්ලංඝණය කරමින් ධාවනයේ යෙදීම..(MJ -01)

- පළමුවර පරිපාලන සේවා ගාස්තුව රු. 2,000/=
- දෙවනවර පරිපාලන සේවා ගාස්තුව රු. 5,000/=
- තෙවැනිවර පරිපාලන සේවා ගාස්තුව රු. 7,500/=

වාර 4 හෝ ඊට වැඩි වාර ගණනකදී ජාතික ගමනාගමන කොමිෂන් සභාව තීරණය කරන කාලසීමාවකට මගී සේවා අවසරපත්‍රය අත්හිටුවීම.

**4)**

i) මගී ප්‍රවාහනය කරන අවස්ථාවේදි වායු සමීකරණය නිසි පරිදි ක්‍රියාත්මකව නොකිරීම. (MJ -02)

ii) ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ අනුමත පිරිවිතරයන්ට අනුකූල නොවන තත්වයේ බස් රථයක් මගී ප්‍රවාහනයට යෙදවීම. (MJ -03)

- පළමුවර පරිපාලන සේවා ගාස්තුව රු. 5,000/=
- දෙවනවර පරිපාලන සේවා ගාස්තුව රු. 7,500/=
- තෙවැනිවර පරිපාලන සේවා ගාස්තුව රු. 10,000/=

වාර 4 හෝ ඊට වැඩි වාර ගණනකදී ජාතික ගමනාගමන කොමිෂන් සභාව තීරණය කරන කාලසීමාවකට මගී සේවා අවසරපත්‍රය අත්හිටුවීම.

**5)** i) ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ බලයලත් නිලධාරීන් විසින් බස්රථය නතර කරන ලෙසට අතින් දෙනු ලබන සංඥාව නොසලකා ධාවනයේ යෙදීම / ඉල්ලා සිටින ලේඛණ පරීක්ෂාවට ලබාදිම ප්‍රතික්ෂේප කිරීම. (MJ -04)

ii) ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ බලයලත් නිලධාරීන් විසින් දෙනු ලබන වාචික හා ලිඛිත නියෝග ක්‍රියාත්මක නොකිරීම. (MJ -05)

(iii) ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ බලයලත් නිලධාරීන්ට බස්රථයේ අදාල ලේඛණ පරීක්ෂාකිරීමට ඉදිරිපත් නොකර ප්‍රතික්ෂේප කිරීම. (MJ -06)

- පළමුවර පරිපාලන සේවා ගාස්තුව රු. 1,000/=
- දෙවනවර පරිපාලන සේවා ගාස්තුව රු 1,000/= + පුහුණුවට යොමු කිරීම

තෙවැනිවර ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ ලියාපදිංචි රියදුරු/කොන්දොස්තරවරයාගේ සේවය නියමිත කාලසීමාවකට යටත්ව අත්හිටුවා රියදුරු/කොන්දොස්තර හැඳුනුම්පත ජාගකොස භාරයට ගැනීම.

**6)**

(i) ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ ලියාපදිංචි නොමැති රියදුරෙකු / කොන්දොස්තරවරයෙකු සේවයේ යෙදවීම. (MJ -07)

(ii) බස් ගාස්තු සටහන ප්‍රදර්ශනය කර නොතිබීම. (MJ -08)

පළමුවර පරිපාලන සේවා ගාස්තුව රු. 1,000/=

දෙවනවර පරිපාලන සේවා ගාස්තුව රු. 2,000/=

තෙවැනිවර පරිපාලන සේවා ගාස්තුව රු. 3,000/=

වාර 4 හෝ ඊට වැඩි වාර ගණනකදී ජාතික ගමනාගමන කොමිෂන් සභාව තීරණය කරන කාලසීමාවකට මගී සේවා අවසරපත්‍රය අත්හිටුවීම.

**7)** i) වලංගු යෝග්‍යතා සහතිකයක් නොමැතිව ධාවනය කිරීම. (MJ -09)

ii)ජාගකොස හැඳුනුම්පත්හිමි රියදුරු/කොන්දොස්තරවරයෙක් විසින් ජාගකොස මඟින් සේවය අත්හිටුවා ඇති අවස්ථාවකදී සේවයේ යෙදී ඇති බවට තහවුරුවිම. (MJ -10)

- පළමුවර පරිපාලන සේවා ගාස්තුව රු. 1,000/=
- දෙවනවර පරිපාලන සේවා ගාස්තුව රු 2,000/=
- තෙවැනිවර පරිපාලන සේවා ගාස්තුව රු. 3,000/=

වාර 4 හෝ ඊට වැඩි වාර ගණනකදී ජාතික ගමනාගමන කොමිෂන් සභාව තීරණය කරන කාලසීමාවකට මගී සේවා අවසරපත්‍රය අත්හිටුවීම.

**8)** කොන්දොස්තර මහතා විසින් මගීන්ට විධිමත් ප්‍රවේශපත්‍රයක් නිකුත් නොකිරීම. (MJ -11)

- පළමුවර පරිපාලන සේවා ගාස්තුව රු. 1,000 /= + සේවාස්ථ පුහුණුවකට යොමු කිරීම
- දෙවනවර පරිපාලන සේවා ගාස්තුව රු 3,000/= + සේවාස්ථ පුහුණුවකට යොමු කිරීම
- තෙවැනිවර පරිපාලන සේවා ගාස්තුව රු. 5,000/= + කොන්දොස්තර හැඳුනුම්පත සතියක කාලයකට අත්හිටුවීම

වාර 4 හෝ ඊට වැඩි වාර ගණනකදී ජාතික ගමනාගමන කොමිෂන් සභාව තීරණය කරන කාලසීමාවකට මගී සේවා අවසරපත්‍රය අත්හිටුවීම.

**9)** ආසනගත මගීන් පමණක් ප්‍රවාහනය කිරීමට අනුමත කර ඇති (අර්ධ සුඛෝපභෝගී, සුඛෝපභෝගී සහ අධි සුඛෝපභෝගී) බස් රථවල අනුමත සංඛ්‍යාවට වඩා මගීන් ප්‍රවාහනය කිරීම. (MJ -12)

i) පළමුවර පරිපාලන සේවා ගාස්තුව එක් මගියෙකුට රු.500/= බැගින් අය කිරීම සහ මගීන් ගණනට සමාන දින ගණනක් රියදුරු / කොන්දොස්තර දෙදෙනාගේ සේවය අත්හිටුවා රියදුරු/කොන්දොස්තර දෙදෙනාගේ හැඳුනුම්පත ජාගකොස භාරයට ගැනීම.

ii) දෙවනවර පරිපාලන සේවා ගාස්තුව රු 1,000/= බැගින් අය කිරීම සහ මගීන් ගණනට සමාන දින ගණනක් රියදුරු / කොන්දොස්තර දෙදෙනාගේ සේවය අත්හිටුවා රියදුරු/කොන්දොස්තර දෙදෙනාගේ හැඳුනුම්පත ජාගකොස භාරයට ගැනීම.

iii) තෙවැනිවර පරිපාලන සේවා ගාස්තුව රු. 1,500/= බැගින් අය කිරීම සහ මගීන් ගණනට සමාන දින ගණනක් රියදුරු / කොන්දොස්තර දෙදෙනාගේ සේවය අත්හිටුවා රියදුරු/කොන්දොස්තර දෙදෙනාගේ හැඳුනුම්පත ජාගකොස භාරයට ගැනීම.

වාර 4 හෝ ඊට වැඩි වාර ගණනකදී ජාතික ගමනාගමන කොමිෂන් සභාව තීරණය කරන කාලසීමාවකට මගී සේවා අවසරපත්‍රය අත්හිටුවීම.

**10)** ව්‍යාජ සහ කූට ලෙස සකස් කරන ලද ලේඛණ ඉදිරිපත් කිරීම. (MJ -13)

ව්‍යාජ සහ කූට ලෙස සකස් කරන ලද ලේඛණ ඉදිරිපත් කරන ලද අවස්ථාවකදී නීතිමය පියවර ගැනීම සඳහා පොලීසිය වෙත ඉදිරිපත් කිරීම සහ නීතිමය පියවර ගන්නා තෙක් මගී සේවා අවසරපත්‍රය තාවකාලිකව අත්හිටුවීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත යොමු කිරීම.

**11)** (i) බස්රථයේ ඉදිරිපස හා පසුපස අනුමැතිය නොලත් ඇඳීම් හා ලිවීම්, ස්ටිකර් වලින් යුක්ත වීම.(MJ -14)

(ii) බස්රථයේ වීදුරු කොටස් / වාමුවා වීදුරු පාටකර හෝ පින්තාරුකර හෝ ස්ටිකර් වලින් යුක්තවීම. (MJ -15)

(iii) බස් නැවතුම්පල තුළ හෝ බස් රථ තුළ මුදල් ඔට්ටුවට තබා සූදු වැනි ක්‍රීඩාවල යෙදීම.(MJ -16)

(iv) පාපුවරුවේ මගීන් රැගෙන යාම (MJ -17)

- පළමුවර පරිපාලන සේවා ගාස්තුව රු. 1,000/=
- දෙවනවර පරිපාලන සේවා ගාස්තුව රු. 2,000/=
- තෙවැනිවර පරිපාලන සේවා ගාස්තුව රු. 3,000/=

වාර 4 හෝ ඊට වැඩි වාර ගණනකදී ජාතික ගමනාගමන කොමිෂන් සභාව තීරණය කරන කාලසීමාවකට මගී සේවා අවසරපත්‍රය අත්හිටුවීම.

**12)** පහත සඳහන් උපකරණ / පුවරු / ලේඛණ බස්රථය තුළ තබා නොගැනීම. (MN -01)

(i) ප්‍රථමාධාර උපකරණ හා ඖෂධ අඩංගු ප්‍රථමාධාර පෙට්ටියක් සවිකර නොතිබීම.

(ii) පහසුවෙන් ක්‍රියාත්මක කළහැකි සක්‍රීය සීනුවක් / ක්‍රියාත්මක ඔරලෝසුවක් හා / හෝ කල් ඉකුත් නොවූ ගිනිනිවීමේ උපකරණයක් බස්රථය තුළ සවිකර නොතිබීම

(iii) මගී සේවා අවසරපත්‍රයේ නීත්‍යානුකූල හිමිකරුගේ නම. තැපැල් ලිපිනය හා දුරකතන අංකය නියමිත ස්ථානයේ ප්‍රදර්ශනය කර නොතිබීම.

(iv) නියමානුකූලව නඩත්තු කරනු නොලැබූ ලොග් පත්‍රයක් බස්රථය තුළ තබා ගැනීම.

(v) මාර්ග අංකය සහිතව අනුමත ගමනාන්ත පුවරු සවිකර නොතිබීම.

(vi) බස් රථයේ ඉදිරිපස හා පිටුපස ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ ලාංඡනයක් අලවා නොතිබීම

- පළමුවර පරිපාලන සේවා ගාස්තුව රු. 500/=
- දෙවනවර පරිපාලන සේවා ගාස්තුව රු. 1,000/=
- තෙවැනිවර පරිපාලන සේවා ගාස්තුව රු. 1,500/=

වාර 4 හෝ ඊට වැඩි වාර ගණනකදී ජාතික ගමනාගමන කොමිෂන් සභාව තීරණය කරන කාලසීමාවකට මගී සේවා අවසරපත්‍රය අත්හිටුවීම.

**13)** i) සෝෂාකාරී ගුවන්විදුලි යන්ත්‍ර / රූපවාහිනී හඬ පාලනය නොකිරීම සහ විවිධ වයස් සීමාවල මගීන්ට නුසුදුසුවන ආකාරයේ දර්ශන බස්රථය තුළ ප්‍රදර්ශනය කිරීම සහ ප්‍රචාරය කිරීම (MN -02)

ii) බස්රථයේ අනුමත සේවක කණ්ඩායමට අතිරේකව/පරිබාහිරව වෙනත් තැනැත්තෙක් සේවයේ යෙදවීම. . (MN -03)

- පළමුවර පරිපාලන සේවා ගාස්තුව රු. 1,000/=
- දෙවනවර පරිපාලන සේවා ගාස්තුව රු. 3,000/=
- තෙවැනිවර පරිපාලන සේවා ගාස්තුව රු. 5,000/=

වාර 4 හෝ ඊට වැඩි වාර ගණනකදී ජාතික ගමනාගමන කොමිෂන් සභාව තීරණය කරන කාලසීමාවකට මගී සේවා අවසරපත්‍රය අත්හිටුවීම.

**14)** බස්රථය මගී ප්‍රවාහනයේ යෙදෙන අවස්ථාවලදී දොරවල් වසා නොතිබීම. (MN -04)

- පළමුවර පරිපාලන සේවා ගාස්තුව රු. 500/=
- දෙවනවර පරිපාලන සේවා ගාස්තුව රු. 1,000/=
- තෙවැනිවර පරිපාලන සේවා ගාස්තුව රු. 1,500/=

වාර 4 හෝ ඊට වැඩි වාර ගණනකදී ජාතික ගමනාගමන කොමිෂන් සභාව තීරණය කරන කාලසීමාවකට මගී සේවා අවසරපත්‍රය අත්හිටුවීම.

**15)** පහත සඳහන් තොරතුරු / ස්ටිකර් ප්‍රදර්ශනය නොකිරීම. (MN -05)

i) බස්රථය ඇතුළත (පූජ්‍ය පක්ෂය, ගැබිනි මාතා, ආබාධිත පුද්ගලයින් සඳහා) ආසන වෙන්කිරීම් සහ “දුම්බීම තහනම්” දැන්වීම ප්‍රදර්ශනය නොකිරීම

ii) බස්රථය ගමන් ආරම්භ කරන හා අවසන් කරන වේලාව සටහන් නොකිරීම

iii) බස්රථය තුළ බස්රථයේ ලියාපදිංචි අංකය ප්‍රදර්ශනය නොකිරීම

iv) බස්රථය තුළ රියදුරු / කොන්දොස්තර ලියාපදිංචි අංකය ප්‍රදර්ශනය නොකිරීම

- පළමුවර පරිපාලන සේවා ගාස්තුව රු. 500/=
- දෙවනවර පරිපාලන සේවා ගාස්තුව රු. 750/=
- තෙවැනිවර පරිපාලන සේවා ගාස්තුව රු.1,000/=

වාර 4 හෝ ඊට වැඩි වාර ගණනකදී ජාතික ගමනාගමන කොමිෂන් සභාව තීරණය කරන කාලසීමාවකට මගී සේවා අවසරපත්‍රය අත්හිටුවීම.

**16)** (i) ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් ලබාදි ඇති රියදුරු / කොන්දොස්තර නිල ඇඳුමින් සැරසී සේවයේ නොයෙදීම. (MN -06)

ii) රියදුරු / කොන්දොස්තරවරයා හැඳුනුම්පත කල් ඉකුත්වී තිබියදී සේවයේ යෙදීම. (MN -07)

- පළමුවර පරිපාලන සේවා ගාස්තුව රු. 250/=
- දෙවනවර පරිපාලන සේවා ගාස්තුව රු. 300/=
- තෙවැනිවර පරිපාලන සේවා ගාස්තුව රු.500/=

වාර 4 හෝ ඊට වැඩි වාර ගණනකදී ජාතික ගමනාගමන කොමිෂන් සභාව තීරණය කරන කාලසීමාවකට මගී සේවා අවසරපත්‍රය අත්හිටුවීම.

**17)**

i) බස් රථය තුළ සිගා කෑම සහ වෙළඳාම් කිරීමට අවසර ලබා දීම. (MN -08)

ii) ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ නීත්‍යානුකූල අවසරයකින් තොරව විශේෂ වාරිකාවක යෙදීම. (MN -09)

- පළමුවර පරිපාලන සේවා ගාස්තුව රු. 200/=
- දෙවනවර පරිපාලන සේවා ගාස්තුව රු. 500/=
- තෙවැනිවර පරිපාලන සේවා ගාස්තුව රු.750/=

වාර 4 හෝ ඊට වැඩි වාර ගණනකදී ජාතික ගමනාගමන කොමිෂන් සභාව තීරණය කරන කාලසීමාවකට මගී සේවා අවසරපත්‍රය අත්හිටුවීම.

**18)** බස් රථය මගීන් සමඟ ධාවනයේ යෙදෙන අතරතුර ඉන්ධන ලබා ගැනීම. (MN -10)

- පළමුවර පරිපාලන සේවා ගාස්තුව රු. 500/=
- දෙවනවර පරිපාලන සේවා ගාස්තුව රු. 750/=
- තෙවැනිවර පරිපාලන සේවා ගාස්තුව රු.1,000/=

වාර 4 හෝ ඊට වැඩි වාර ගණනකදී ජාතික ගමනාගමන කොමිෂන් සභාව තීරණය කරන කාලසීමාවකට මගී සේවා අවසරපත්‍රය අත්හිටුවීම.

**19)** මාසයකට වඩා කල් ඉකුත්වූ නිලධාරි වාර්තා විමර්ෂණය සඳහා ඉදිරිපත් කිරීම. (MN -11)

- පළමුවර පරිපාලන සේවා ගාස්තුව රු. 1,000/=
- දෙවනවර පරිපාලන සේවා ගාස්තුව රු. 1,500/=
- තෙවැනිවර පරිපාලන සේවා ගාස්තුව රු.2,000/=

වාර 4 හෝ ඊට වැඩි වාර ගණනකදී ජාතික ගමනාගමන කොමිෂන් සභාව තීරණය කරන කාලසීමාවකට මගී සේවා අවසරපත්‍රය අත්හිටුවීම.

**20)** වෙනත් සුළු වැරදි වශයෙන් පහත දක්වා ඇති වැරදි ඇතුලත් වේ. (MN -12)

- මගීන්ට හා අනෙකුත් බස් රථ වලට හිරිහැරවන ආකාරයට සෝෂාකාරි ලෙස කෑගසමින් මගීන් නංවා ගැනිම
- සනීපාරක්ෂක පහසුකම් නිසි ආකාරව පාවිච්චි නොකිරීම
- බස් නැවතුම්පල තුළ අපද්‍රව්‍ය හෝ වෙනත් කසල ද්‍රව්‍ය නිසිතැන්හි බැහැර නොකිරීම
- බුලත්විට කෑම සහ බුලත් කෙළ ගසා බස් රථය සහ බස් නැවතුම්පල අපිරිසිදු කිරීම
- අනෙක් බස් රථවලට බාධාවන පරිදි බස්නැවතුම්පල තුළ බස් රථ ධාවනය කිරීම, අනෙක් බස් රථවලට බාධාවන පරිදි බස් රථය පිටුපසට ගැනීම සහ අනෙක් බස් රථ වලට බාධාවන පරිදි නතර කර තැබීම
- ජීපීඑස් යන්ත්‍රය අක්‍රිය කිරීම හෝ ජීපීඑස් යන්ත්‍රය ක්‍රියාකාරිව නොමැතිව ධාවනය කිරීම
- මගීන්ට අවහිර වන සේ බස් රථය තුළ ගමන්බඩු පැටවීම
- බස් නැවතුම්පල තුළ අදාල මගී සේවා අවසරපත්‍රයේ බලය ලබාදී ඇති ගමන් ආරම්භක ස්ථානයට අදාල පර්යන්තයෙන් බැහැරව වෙනත් පර්යන්තයකට බස් රථය ඇතුල් කිරීම

ඉහත එක් චෝදනාවකට රු.500/= ක පරිපාලන සේවා ගාස්තුවක් බැගින් සෑම වාරයකදීම අයකරනු ලැබේ.

***<u>සැළකිය යුතුයි</u>***

රියදුරු හෝ කොන්දොස්තරවරුන් විසින් නියෝග කඩකිරීම මගි සේවා අවසරපත්‍ර හිමිකරු විසින් කරන නියෝග කඩකිරීමක් සේ සළකනු ලැබේ.